# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT


මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01

நிதி அமைச்சு
செயலகம், கொழும்பு 01

MINISTRY OF FINANCE
The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No: DMA/AMC/02/2021/02

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.06.30

සියලුම අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ, විශේෂ වියදම් ඒකක, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/අභ්‍යන්තර විගණකවරුන් වෙත,

**වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම - 2022**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කරන ලද අංක DMA/AMC/02/2021/02 හා 2021.04.05 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ ලිපි අංක DMA/01-2019/01 සහ 2021.06.17 දිනැති ලිපි කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

02. උක්ත ලිපි මගින් 2022 වර්ෂයේ සිට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මක් ලෙස සකස් කළ යුතු බව දැනුම් දී ඇත. තවද ඒ සඳහා අවශ්‍ය අවදානම් ලේඛනය සියලුම ආයතන විසින් 2021 වර්ෂයේ ජූලි මස වන විට පිළියෙල කල යුතු බවත්, 2021 වර්ෂයේ ජූලි මස අවසානයේ දී අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලබන බවත් ඔබ වෙත දැනුම් දී ඇත.

03. අවදානම් ලේඛනය සකස් කිරීම පිළිබඳව සහ අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙළ කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගී වන විට ඔබ ආයතනය සඳහා වූ අවදානම් ලේඛනය ඔබට හැකි මට්ටමෙන් සකස් කර රැගෙන ඒම පුහුණුවට අවශ්‍ය වේ.

04. මෙම පුහුණු වැඩසටහන සංවිධානය කිරීම සඳහා අවදානම් ලේඛනය පිළියෙල කිරීම පිළිබඳ වර්තමාන ප්‍රගතිය ලබා ගැනිම අවශ්‍ය වී ඇත. ඒ අනුව ඔබ විසින් ඔබගේ ආයතනය සඳහා වන අවදානම් ලේඛනය පිළියෙළ කිරීම පිළිබඳ පහත සඳහන් තොරතුරු 2021.07.16 දිනට පෙර තැපැල මගින් සහ dma.treasuary@gmail.com යන විද්‍යුත් තැපැල වෙත යොමුකිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

i. අවදානම් ලේඛනය සකස්කර අවසන් කර තිබේ ද?
ii. අවදානම් ලේඛනය සකස් කිරීම සම්පූර්ණ කර නොමැති නම් එහි වර්තමාන තත්ත්වය.
iii. අවදානම් ලේඛනය මෙතෙක් සකස් කර නොමැති නම් අවසන් කළ හැකි දිනය?

05. මෙම පුහුණු වැඩසටහන සාර්ථක කර ගැනිම සඳහා උක්ත කරුණු සම්බන්ධයෙන් කඩිනම් ප්‍රතිචාර ඔබ වෙතින් අපේක්ෂා කරමි.

එස්.ජේ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්